(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **29.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 මැයි 04 බදාදා පූ.භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **නාලක ගොඩහේවා මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,** වරාය සහ නාවික අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා, සංචාරක අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** බලශක්ති අමාත්‍යතුමා සහ විදුලිබල අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **එම්.යූ.එම්. අලි සබ්රි මහතා,** මුදල් අමාත්‍යතුමා, අධිකරණ අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ සහ බන්ධනාගාර පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා

ගරු **කපිල අතුකෝරල මහතා,** සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය,** සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමිය

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩයනා ගමගේ මහත්මිය,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා,** ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** සංචාරක රාජ්‍ය අමාත්‍යතුමා සහ ධීවර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රෝහණ දිසානායක මහතා,** පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා,** සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** වැවිලි රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක ප්‍රියන්ත මහතා,** වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** කාබනික පොහොර නිෂ්පාදන සහ දියුණු තාක්ෂණ කෘෂිකර්ම ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** මහාමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කේ. කාදර් මස්තාන් මහතා,** ග්‍රාමීය ආර්ථික භෝග වගා සහ ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,** පේෂ කර්මාන්ත හා දේශීය ඇඟළුම් නිෂ්පාදන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බී. වයි. ජී. රත්නසේකර මහතා,** සමූපකාර සේවා, අළෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තෙ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** තරුණ හා ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු මහින්ද අමරවීර මහතා

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෛයි අරසන් මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ටිරාන් අලස් මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු  උදයන කිරිඳිගොඩ මහතා

ගරු  ලලිත් වර්ණ කුමාර මහතා

ගරු  ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු  කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු  වේලු කුමාර් මහතා

ගරු  කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු  නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු  මනෝ ගනේෂන් මහතා

ගරු  උදය ගම්මන්පිල මහතා

ගරු  (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු  උදයකාන්ත ගුණතිලක මහතා

ගරු  කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු  (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු  යදාමිණී ගුණවර්ධන මහතා

ගරු  එස්.එම්. චන්ද්‍රසේන මහතා

ගරු  මිලාන් ජයතිලක මහතා

ගරු  නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු  පියංකර ජයරත්න මහතා

ගරු  (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු  දයාසිරි ජයසේකර මහතා

ගරු  ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු  එම්. එස්. තවුෆික් මහතා

ගරු  කුලසිංහම් තිලීපන් මහතා

ගරු  ජීවන් තොන්ඩමන් මහතා

ගරු  චාමර සම්පත් දසනායක මහතා

ගරු  නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු  ශාන් විජේලාල් ද සිල්වා මහතා

ගරු  (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු  පලනි දිගම්බරම් මහතා

ගරු  අනුර දිසානායක මහතා

ගරු  එස්. බී. දිසානායක මහතා

ගරු  දුමින්ද දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පැස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්.එම්. මරික්කාර් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුන රණවක මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු විජේදාස රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා

ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ගාමිණී වලේගොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු එච්.එම්.එම්.හාරිස් මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1.කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක්කරන ලද 'කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන)' නැමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පහත පරිදි දැක්වේ:-

පනත් කෙටුම්පතේ I වන උපලේඛනය සමඟ කියවිය යුතු 2(1) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) ව්‍යවස්ථාවට අනනුකූල බවත් එය සම්මත කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාවේ සඳහන් පරිදි විශේෂ බහුතරයකින් පමණක් බවත් අධිකරණය විසින් තීරණය කර ඇත.

කාරක සභා අවස්ථා සංශෝධනයක් මගින් පනත් කෙටුම්පතේ I වන උපලේඛනයෙන් 49 වැනි අයිතමය ඉවත් කළ හැකි බවත්; එසේ සංශෝධිත I වන උපලේඛනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවත් නීතිපතිවරයා විසින් දන්වා ඇත.

පනත් කෙටුම්පතේ 2(1) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4(ඇ), 111උ.(1)(ආ) සහ 111ඕ.(අ) ව්‍යවස්ථාවලට අනනුකූල බවත්, එය සම්මත කළ හැක්කේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84(2) ව්‍යවස්ථාව අනුකූලව විශේෂ බහුතර ඡන්දයකින් සහ 83 වැනි ව්‍යවස්ථාවට අනුකූලව, ජනමත විචාරණයක දී ජනතාව විසින් අනුමත කොට ඇත්නම් පමණක් බවත් අධිකරණය විසින් දන්වා ඇත.

කාරක සභා අවස්ථා සංශෝධනයක් මඟින් පනත් කෙටුම්පතේ 2(1) වගන්තිය සලකා බලනු ලබන විධිවිධාන ඉවත් කළ හැකි බව නීතිපතිවරයා විසින් දන්වා ඇත.

එසේ සංශෝධනය කරන ලද 2(1) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බව තවදුරටත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දන්වා ඇත.

තවද, පනත් කෙටුම්පතේ 2, 3 වැනි වගන්ති, I වැනි උපලේඛනය සහ දීර්ඝ නාමය මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් කර ඇති පරිදි සංශෝධනය කළහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දක්වන අනනුකූලතාවය ඉවත්ව යනු ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දන්වා ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යයි මම නියෝග කරමි.''

II

''පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධාන සහ 2022 ජනවාරි 20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා''

**2.ලිපි ලේඛනාදිය පිළිගැන්වීම**: (1) මහජන ආරක්ෂක අමාත්‍ය සහ සංචාරක අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ටවර් හෝල් රඟහල පදනමේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කර එම වාර්තාව, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) මහජන ආරක්ෂක අමාත්‍ය සහ සංචාරක අමාත්‍යවරයා විසින් 2020 අගෝස්තු 05 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) අධ්‍යාපන අමාත්‍ය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) මුදල් අමාත්‍ය, අධිකරණ අමාත්‍ය සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2021 අංක 30 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2022.02.24 සිට 2022.03.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3.පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව, — පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4.අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 1)**: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 (1) හි විධිවිධාන ප්‍රකාරව සහ 2022 අප්‍රේල් 28 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, 2022 ජනවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා තිස් දෙක (32) ට අමතරව, සමෘද්ධි සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පත් කළ යුතු ය.

එකී කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කර බලා වාර්තා කිරීම සඳහා එකී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් (5) සමන්විත විය යුතුය.

එකී අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් (3) සංයුක්ත විය යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5.අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 2)**: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2022 ජනවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2022 අප්‍රේල් 28 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව "වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව" ලෙස නැවත නම් කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6.අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2022 ජනවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2022 අප්‍රේල් 28 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව "රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව" ලෙස නැවත නම් කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රංජිත් සියඹලාපිටිය මහතා නියෝජ්‍ය කථානායක සහ කාරක සභා සභාපති ධුරයෙන් ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් පිළිගත් බවට දන්වා ජනාධිපති ලේකම් විසින් තමා වෙත ලිපියක් එවන ලද බව කථානායකවරයා විසින් සභාවට දැනුම් දෙන ලදී.

(අ.භා. 12.57 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි විදේශ කටයුතු අමාත්‍ය සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.47ට ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.)

''ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතු ය'' යි අධ්‍යාපන අමාත්‍ය සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.38ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

''ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය'' යි රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.37 ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

**7.කල් තැබීම:** එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් අද දින සභා සම්මතිය අනුව මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2022 මැයි 05 බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 වනතෙක් කල් ගියේය.